ශ්‍රී ලංකාවේ හරිත හයිඩ්‍රජන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

2026

බලශක්ති අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

පටුන

1.0 හැඳින්වීම 1

1.1 පසුබිම 1

1.2 ප්‍රතිපත්තියක අවශ්‍යතාව 2

1.3 අරමුණ සහ සන්දර්භය 3

1. 4තර්කානුකූල පදනම 4

2.0 විෂය පථය 4

3.0 මාර්ගෝපදේශකත්ව මූලධර්ම 4

4.0 ප්‍රතිපත්ති ප්‍රකාශන 5

4.1 ආර්ථිකය සවිබලගැන්වීම 5

4.1.1 තිරසර ආර්ථික ප්‍රතිලාභ 5

4.1.2 බලශක්ති සුරක්ෂිතතාව, විමෝචනය අවම කිරීම සහ චක්‍රීය ආර්ථිකය 5

4.2 දැනුම උපයෝගී කර ගැනීම 5

4.2.1 පර්යේෂණ සිදුකිරීම, නවෝත්පාදන සිදු කිරීම, දැනුම බිහිකිරීම සහ ප්‍රචාරණය කිරීම 5

4.2.2 නිපුණතා සංවර්ධනය කිරීම 6

4.2.3 තොරතුරු ව්‍යාප්ත කිරීම 6

4.2.4 පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය 6

4.3 ඵලදායී පරිසර පද්ධතියක් 6

4.3.1 ක්‍රියාත්මක කිරීමේ ආයතනය 6

4.3.2 මෙහෙයුම් කමිටුව සහ විශේෂඥ කමිටුව 6

4.3.3 නෛතික සහ ආයතනික රාමු 7

4.3.4 ආයතන සම්බන්ධීකරණය 7

4.3.5 අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම 7

4.4 ප්‍රවේසම සහ සුරක්ෂිතතාව 8

4.4.1 පුද්ගලික සෞඛ්‍ය සහ ආරක්ෂාව 8

4.4.2. ප්‍රමිති සහ රෙගුලාසි 8

4.4.3 අවදානම් කළමනාකරණය කිරීම 8

4.5 තාක්ෂණයේ ප්‍රමුඛතාව 9

4.5.1 මෙවලම් සහ තාක්ෂණයන් 9

4.5.2 දත්ත කළමනාකරණ පද්ධතිය 9

5.0 ප්‍රතිපත්ති ඉලක්ක 9

6.0 ප්‍රතිපත්තියේ අදාළත්වය 9

7.0 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග 10

7.1 අනුකූලතාව, ධාරිතාව ගොඩනැංවීම සහ මහජන පිළිගැනීම 10

7.2 කළමනාකරණය**,** වගකීම සහ අධිකාරිය 12

7.3 අධීක්ෂණය සහ ඇගයීම 13
8.0 ක්‍රියාත්මක කෙරෙන ආකාරය 14
පද මාලාව 14
ඇමුණුම 1: ආශ්‍රිත පනත්, ප්‍රතිපත්ති සහ අන්තර්ජාතික සම්මුතීන් 16
(අ) ආශ්‍රිත පනත් 16
(ආ) ආශ්‍රිත ප්‍රතිපත්ති 17
(ඇ) ආශ්‍රිත අන්තර්ජාතික සම්මුතීන් සහ බැඳීම් 17

ශ්‍රී ලංකාවේ හරිත හයිඩ්‍රජන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

බලාත්මක වන දිනය:

1.0 හැඳින්වීම

1.1 පසුබිම

බලශක්ති ස්වාධීනත්වය සහ සුරක්ෂිතතාව ළඟාකරගැනීම ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කෙරෙහි මූලික වශයෙන් වැදගත් වී තිබේ. මෙරට සතුව පවතින පුනර්ජනනීය මූලාශ්‍රයන් (උදා: සූර්ය, සුළං, ජල,ජෛව ස්කන්ධ,ජෛව අපද්‍රව්‍ය) මඟින් බලශක්තිය සපයා ගත හැකි විභවය අති විශාල ය. වාර්ෂිකව ටෙරාවොට් පැය 4.5කට වඩා (~ 40%ක විදුලිබල පද්ධති ධාරිතාවක්) උත්පාදනය කරනු ලබන, මෙගාවොට් 1,800කට වඩා වැඩි ප්‍රධාන ජල විදුලි සහ කුඩා ජල විදුලි බලාගාර ධාරිතාවකින් සමන්විත ජල විදුලිය යනු එබඳු වඩාත් පෘථුල බලශක්ති මූලාශ්‍රයකි.

පුනර්ජනනීය බලශක්තිය මූලික කරගත් විදුලිබල උත්පාදනය හා සම්බන්ධ මෑත කාලීන සංවර්ධනයන් තුළ, සූර්ය බලශක්තිය සහ සුළං බලය ප්‍රධාන වශයෙන් අවධානයට ලක්ව තිබේ. වසර 2030 වන විට විදුලි ජනනයෙන් 70%ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් සපුරා ගැනීම මධ්‍ය කාලීන ප්‍රතිපත්ති ඉලක්කය බවට පත් වී ඇත. 2050 වසර වන විට කාබන් ශුද්ධ-ශුන්‍ය කිරීමේ මාර්ග සිතියම සහ උපාය මාර්ගික සැලැස්ම පෙරදැරි වූ ජාතික අනුවර්තන සැලැස්ම සහ දේශගුණික සමෘද්ධි සැලැස්ම ඇතුළත් පැරිස් ගිවිසුමේ බැඳීම් යටතේ වන ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් (NDCs) තුළ ද ප්‍රධාන උපාය මාර්ගය බවට පත් වී ඇත්තේ පුනර්ජනනීය බලශක්තිය ක්‍රියාවට නංවනු ලැබීම ය. 2025 වසරේ දෙසැම්බර් මස වන විට, ශ්‍රී ලංකා භූමිය මත ස්ථාපිත සූර්ය සහ සුළං විදුලි බලාගාර වලින් මෙගාවොට් 550ක දායකත්වයක් ලැබී ඇති අතර, මෙගාවොට් 2,100කට වඩා වැඩි සමස්ත ධාරිතාවක් සමඟින් පියැසි පාදක සූර්ය බලශක්තියේ ද විශාල ඉහළ යාමක් සිදුවී ඇත. ඉදිරි වසර 25 තුළ, මෙරට බලශක්ති ඉල්ලුම වාර්ෂිකව ~5%ක අනුපාතයකින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා තබා ඇති විටක, ප්‍රධාන වශයෙන් සූර්ය බලශක්තිය සහ සුළං බලශක්තිය සමන්විත වූ ~ මෙගාවොට් 7,000ක පමණ අමතර නව පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් එක් කිරීමේ අවශ්‍යතාව ශ්‍රී ලංකාව තුළ පැන නැඟෙනු ඇත. සූර්ය බලශක්තියෙන් සහ සුළං බලශක්තියෙන් විදුලිය උත්පාදනය කිරීම සම්බන්ධයෙන් ගත් කල, සූර්ය බලශක්තියේ සහ සුළං ශක්තියේ කඩින් කඩ ජනනය කිරීමේ ස්වභාවය දෛනික කාලගුණික තත්ත්වයන් මත පදනම්ව ඒවායේ විදුලි නිෂ්පාදනය උච්චාවචනය වීම කෙරෙහි හේතු වන බැවින් මෙම ගැටළුව මඟහරවා ගැනීමට නම් බලශක්ති ගබඩා කිරීම සම්බන්ධයෙන් හඳුන්වා දීම අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වනු ඇත. බලශක්ති ගබඩා කිරීම සම්බන්ධයෙන් ගත් විට බැටරි බලශක්ති ගබඩා කිරීම සහ ජලය පොම්ප කර ගබඩා කිරීම කෙරෙහි මේ වනවිටත් අවධානය යොමු වී තිබෙන අතර, හරිත හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්නයන් යනු ගෝලීය වශයෙන් අනුගමනය කරන තවත් ගබඩා මාර්ගයක් වේ.

සූර්ය බලශක්ති සහ සුළං බලශක්ති සම්පත් සපයා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් ගත් විට, ශ්‍රී ලංකාව සතුව මෙම ප්‍රභවයන් සම්බන්ධයෙන් ඇත්තේ සැලකිය යුතු ඉහළ පුනර්ජනනීය බලශක්ති විභවයකි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මට අනුව, සංවර්ධනය කළ හැකි භූමිය පාදක සුළං බලශක්ති විභවය ගිගාවොට් 10ක් පමණ වන අතර සංවර්ධනය කළ හැකි භූමිය පාදක සූර්ය බලශක්ති විභවය ගිගාවොට් 30ක් පමණ වේ. අක්වෙරළ සුළං බලශක්ති විභවය ගිගාවොට් 56ක් වන බවත්, පියැසි පාදක සූර්ය බලශක්තිය (rooftop solar power) සහ පාවෙන සූර්ය බලශක්තිය (floating solar power) සම්බන්ධයෙන් සලකා බැලූ කළ සමස්ත සූර්ය බලශක්ති විභවය වඩාත් ඉහළ අගයක් ගන්නා බවත් ලෝක බැංකු සමූහය විසින් සිදු කරන ලද අධ්‍යයනයකින් පෙන්වා දී තිබේ. ඒ අනුව, මෙරට තුළ පවතින ඉහළ පුනර්ජනනීය බලශක්ති විභවය හමුවේ සම්පත් සපයා ගැනීමට තිබෙන්නා වූ බහුල හැකියාව මෙරට විදුලි බලශක්ති ඉල්ලුම ද සැලකිය යුතු ලෙස අභිබවා යයි. එහෙයින් විද්‍යුත් විච්ඡේදන ක්‍රියාවලිය (electrolysis process) හරහා පුනර්ජනනීය විදුලිය හයිඩ්‍රජන් බවට හැරවීම

මඟින් විද්‍යුත් බලශක්තිය රසායනික බලශක්තිය බවට පරිවර්තනය කොට මෙම බහුලව ලබා ගත හැකි බලශක්ති සම්පත මෙරට විවිධ ක්ෂේත්‍රවල බලශක්ති අවශ්‍යතා සපුරාලීම සඳහා යොදා ගැනීමේ හැකියාව පවතී. එපරිදි හරිත හයිඩ්‍රජන් යනු විභව බලශක්ති ගබඩා මාධ්‍යයක් වන බැවින් එය විවිධ යොදාගැනීම් සඳහා බලශක්ති වාහකයක් ලෙස යොදාගනිමින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රයෝජනයට ගැනීම හරහා විවිධ ක්ෂේත්‍ර කාබන්වලින් තොර කරලීමට සැලකිය යුතු දායකත්වයක් ලබා ගත හැකි වේ.

අර්ථ විග්‍රහයට අනුව හරිත හයිඩ්‍රජන් යනු පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතයෙන් ජනනය වන හයිඩ්‍රජන් ය. හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්න (එතනෝල්, මෙතනෝල්, ඇමෝනියා) බලශක්ති සැපයුම් ජාලය සඳහා බලශක්ති වාහකයක් ලෙස මෙන්ම නෞකා ඉන්ධන, තිරසර ගුවන් යානා ඉන්ධන (SAF) වැනි පුළුල් පරිභෝජන අංශ සඳහා සුපිරිසිදු ඉන්ධනයක් ලෙස එක් කරගත හැකි ය. තවද, හයිඩ්‍රජන් යනු රසායනික ක්ෂේත්‍රය තුළ අමුද්‍රව්‍යයක් ලෙස භාවිත වන්නක් වන අතර, එය ශ්‍රී ලංකාව සඳහා අත්‍යවශ්‍ය වෙළඳ භාණ්ඩයක් වූ පොහොරක් වන, එමෙන්ම, ලෝකයේ නිපදවන දෙවන විශාලතම රසායනික ද්‍රව්‍යය ලෙස බහුලව භාවිත වන ඇමෝනියා නිෂ්පාදනය සඳහා මූලික සැකසුම් ද්‍රව්‍යයක් (අමුද්‍රව්‍යක්) ලෙස ද යොදා ගත හැකි ය. හයිඩ්‍රජන් යනු ප්ලාස්ටික්, ලෝහ, ඛනිජ තෙල් සහ ඖෂධ කර්මාන්තවල ද යොදාගැනෙන වැදගත් වෙළඳ ද්‍රව්‍යයක් වන අතර දේශීය කර්මාන්ත ඉහළ නැංවීම සඳහා රජයන් විසින් සිදුකරනු ලබන දිරිගැන්වීම සම්බන්ධයෙන් ගත් විට ද මනාව අනුකූලවන්නකි.

හයිඩ්‍රජන් යනු විශේෂ සැලකිල්ලක් අවශ්‍ය කෙරෙන ඉන්ධනයක් ය. තරඟකාරී පිරිවැයක් යටතේ නිෂ්පාදන සහ සැපයුම් ජාලයක් ස්ථාපිත කරනු ලැබීම මඟින් ඉහළ උෂ්ණත්වයක් උපයෝගී කරගන්නා කර්මාන්ත කෙරෙහි අවධානය යොමු කරමින් (උදා: ප්‍රවාහන, කෘෂිකර්මාන්තය, ඉහළ උෂ්ණත්වයක් උපයෝගී කරගන්නා වානේ, රසායනික ද්‍රව්‍ය, පොහොර, සිමෙන්ති, වීදුරු, පිඟන් මැටි, ටයිල් ඇතුළු කර්මාන්ත) විවිධ ක්ෂේත්‍රවල පාරිභෝගික අවශ්‍යතා සඳහා හයිඩ්‍රජන් තාක්ෂණයන් තිරසර අයුරින් යොදාගැනීමේ හැකියාව ඇත. ශ්‍රී ලංකාව තුළ, ප්‍රථමයෙන්ම හයිඩ්‍රජන් භාවිතය කරා යොමුවනු ඇත්තේ ඉහළ උෂ්ණත්වයක් අවශ්‍ය- පෝරණු සහ උඳුන් භාවිත කරන කරන කර්මාන්තයන් ය. තිරසර ගුවන් යානා ඉන්ධන නිෂ්පාදනයේ දී, නෞකා ඉන්ධන ඇමෝනියා, අධිබර ප්‍රවාහනය, රසායනික ක්ෂේත්‍රය තුළ සහ බලශක්ති පද්ධති ප්‍රත්‍යස්ථතාව සම්බන්ධයෙන් ගත් විට අමුද්‍රව්‍යයක් වශයෙන් හයිඩ්‍රජන් යොදාගැනීම තුළින් මීටත් වඩා විශාල ඉල්ලුමක් අපේක්ෂා කළ හැකි ය. ජෛව අපද්‍රව්‍ය ජෛව හයිඩ්‍රජන් බවට (ජෛව වායුව හරහා) පරිවර්තනය කිරීම සඳහා වූ සැලකිය යුතු විභවයක් ශ්‍රී ලංකාව සතුව පවතින හෙයින්, ඉන් පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි තවදුරටත් දායකත්වය සැපයීම සහ කාබන් අවම ආර්ථිකයක් කරා සංක්‍රමණය වීමට පිටුබලය ලබා දීම සිදු වේ.

ලෝකයේ අන්තර්ජාතික නැව් කර්මාන්තය හයිඩ්‍රජන් ඉන්ධන සැපයුම (hydrogen bunkering) කෙරෙහි අවධානය යොමු කර ඇති සමයක, ශ්‍රී ලංකාව සතුව පවතින උපායමාර්ගික භූගෝලීය පිහිටීම සහ පුනර්ජනනීය බලශක්ති ධාරිතාව හමුවේ, ප්‍රධාන හයිඩ්‍රජන් අපනයනකරුවෙකු වශයෙන් පෙරට ඒමට හැකි විභවයක් මෙරට සතුව ඇත.

1.2 ප්‍රතිපත්තියක අවශ්‍යතාව

ගිගාවොට් පරිමාණයේ සිට ක්ෂුද්‍ර ජාල පරිමාණය දක්වා වූ ප්‍රධාන පරිමාණ සහ කුඩා පරිමාණ යන දෙයාකාරයෙන් ම නිෂ්පාදනය කර භාවිතයට ගැනීමට හැකි අද්විතීය ඉඩ ප්‍රස්ථාවක් පුනර්ජනනීය හයිඩ්‍රජන් හෙවත් හරිත හයිඩ්‍රජන්, එනම් මූලික වශයෙන් සූර්ය බලශක්තිය සහ සුළං බලශක්තිය උපයෝගී කරගනිමින් උත්පාදනය කරන ලද හයිඩ්‍රජන් හරහා ලැබී තිබෙන අතර, වසර 2050 වන විට විදුලිබල උත්පාදනය තුළ කාබන් උදාසීනත්වය හෙවත් අංගාර තුලනය (decarbonization) ළඟා කරගැනීමේ කාබන්හරණ ඉලක්කය සපුරා ගැනීමට සහ ඒ අතරවාරයේදී රටේ ආර්ථික වර්ධනය සඳහා ද සහාය සැලසීමට මෙන් ම තෙල්, ගල් අඟුරු සහ ගෑස් ආනයනය කිරීම් මත යැපීම අඩු කරවීමට ද සහාය ලබාදේ. දේශීය වශයෙන් අවධානය යොමු කර ඇති සහ එකිනෙක හා සම්බන්ධ

හරිත හයිඩ්‍රජන් නිෂ්පාදන සහ සැපයුම් ජාලය ශ්‍රී ලංකාවේ ශුද්ධ-ශුන්‍ය න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරනු ලැබීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇත.

මූලික බාධක මගහරවා ගැනීම සඳහා මෙන් ම වෙළඳපොළ තුළ ව්‍යාප්ත කරවිය හැකි මට්ටමක් කරා ළඟා වීම සඳහා පහත ප්‍රධාන කරුණු තුනක් මත රඳා පවතින්නා වූ ඒකාබද්ධ ප්‍රතිපත්ති ප්‍රවේශයක අත්‍යවශ්‍යතාව පවතී:

(i) ප්‍රතිපත්ති ප්‍රමුඛතා හඳුනා ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම,

(ii) පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සහ ප්‍රතිපත්ති සහිතව ආයෝජනය සහ හවුල්කාරිත්වයන්ට ඉඩ සැලසීම,

(iii) ජාතික හයිඩ්‍රජන් උපාය මාර්ග සහ කළමනාකරණ සැලසුම් සකස් කිරීම.

හරිත හයිඩ්‍රජන් සහ හයිඩ්‍රජන් ව්‍යුත්පන්නයන් පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්තියක් මඟින් අපේක්ෂා කෙරෙනුයේ වසර 2050 වන විට හරිත හයිඩ්‍රජන් නිෂ්පාදනය සහ භාවිතය සඳහා වන කාර්ය රාමුව ක්‍රියාත්මක කිරීමේදී මහා පරිමාණ, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාවසායන් (SME) ආවරණය වන පරිදි, සුරක්ෂිත, විනිවිදභාවයෙන් යුතු සහ තිරසර අයුරින් හරිත හයිඩ්‍රජන් නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, සැපයීම, භාවිතයට ගැනීම සහ අපනයන කිරීම ඇතුළත්ව, පොසිල ඉන්ධනවලින් හරිත බලශක්තිය කරා ගමන් කරන්නා වූ ද, ක්‍රමික මට්ටමින් වූ ද මනා හා ක්‍රමානුකූල සංක්‍රාන්තියක් ඇති කිරීම ය.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ 5(ආ), 13, 16 සහ 21 වගන්තිවලට අනුව, ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා අනුකූලව, ජාතික බලශක්ති මිශ්‍රණයට පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් හඳුන්වා දෙනු ලැබීමේ නීත්‍යානුකූලව බලය පවරන ලද අධිකාරී ආයතනය වන්නේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියයි. එහෙයින්, හරිත හයිඩ්‍රජන් යනු ශ්‍රී ලංකාව තුළ දී ලබා ගැනීමට හැකියාව ඇති සහ දැරිය හැකි මිලක් සහිත බලශක්ති මූලාශ්‍රයක් බවට පත් කරලීම උදෙසා බලශක්ති අමාත්‍යාංශය විසින්, සුනිත්‍ය බලශක්ති අධිකාරී, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සමඟ සහයෝගයෙන් යුතුව එක්ව, අදාළ පනත් සංශෝධනය කරනු ලබමින් සහ මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනයට සහාය වීම සඳහා රෙගුලාසි හඳුන්වා දෙනු ලබමින් සුදුසු නීතිමය රාමුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුව තිබේ.

1.3 අරමුණ සහ සන්දර්භය

ශ්‍රී ලංකාවේ හරිත හයිඩ්‍රජන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, හයිඩ්‍රජන් නිෂ්පාදනය කිරීම, අන්තර්-පරිවර්තනයට ලක් කිරීම (එහි ව්‍යුත්පන්නවලින්/ව්‍යුත්පන්නවලට), ගබඩා කිරීම, ආරක්ෂිතව බෙදා හැරීම, භාවිතයට ගැනීම සහ අපනයනය කිරීම කළමනාකරණය කරනු ලැබීම අරමුණු කරගත් රජයේ උපාය මාර්ග සහ රෙගුලාසි පිළිබඳව දක්වනු ලබන අතර, බලශක්ති සැපයුමේ සුරක්ෂිතභාවය, දැරිය හැකි මිලක් වීම, පාරිසරික තිරසරභාවය, ආර්ථික සමෘද්ධිය, සමාජීයව සහ සදාචාරාත්මකව පිළිගත හැකිවීම අතර සමබරතාව රැකගැනීම කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. එකිනෙක හා සම්බන්ධිත හරිත හයිඩ්‍රජන් යටිතල පහසුකම් ගොඩනැගීම සහ හයිඩ්‍රජන් වෙළඳපොළ සංවර්ධනය කිරීම පිණිස දේශීය මෙන්ම විදේශීය ආයෝජන රැස් කර ගැනීම සඳහා පිළිපැදිය යුතු ප්‍රමිතීන් පිළිබඳ මාර්ගෝපදේශ මෙම ප්‍රතිපත්තිය මඟින් සපයනු ලබයි. ශ්‍රී ලංකාව තුළ හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා වන උපකරණ, කොටස් සහ නිෂ්පාදන ආනයනය කිරීමේදී හෝ දේශීයව සපයා ගනු ලැබීමේ දී කටයුතු කළ යුතු අනුමත කිරීමේ ක්‍රියාවලිය ද එහි විස්තර කර තිබේ.

නවීනතම අන්තර්ජාතික ප්‍රමිතීන් හා අනුකූලවෙමින් ක්‍රියාත්මක කිරීමත්, හයිඩ්‍රජන් යටිතල පහසුකම් ඵලදායී කළමනාකාරීත්වය සමඟින් හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්න ප්‍රවේසම්කාරීව හසුරුවනු ලැබීමත් කළමනාකරණය කරලීම සහතික කරන්නා වූ රජයේ කැපවීම පිළිබඳව මෙම ප්‍රතිපත්තිය තුළින් අවධාරණය කරනු ලබයි. මෙම ප්‍රතිපත්තිය මඟින් හයිඩ්‍රජන් ආශ්‍රිත වූ සුරක්ෂිතභාවය, නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදා හැරීම සහ භාවිතයට ගැනීම සම්බන්ධ රෙගුලාසි ජාතික පරිපාලන රාමුව තුළට

ඒකාබද්ධ කළ යුතු බවට නියම කරනු ලබයි. මෙය එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අභිමතාර්ථ (UN SDGs) සහ ජාතිකව නිර්ණය කරන ලද දායකත්වයන් හා අනුකූල වෙමින්, තිරසර හයිඩ්‍රජන් ආර්ථිකයක් සවිබල ගන්වමින්, බලශක්තිය, පාරිසරික ආරක්ෂාව, සෞඛ්‍ය හා ආරක්ෂාව සහ සමානාත්මතාව පිළිබඳ දැනට පවතින ජාතික ප්‍රතිපත්තිවලට අනුපූරක සහ අනුගත වන පරිදි සකස් කොට තිබේ.

ප්‍රධාන ප්‍රතිපත්ති පරමාර්ථයන් මෙසේය:

(i) හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්නවල ජීව චක්‍රයෙහි සෑම අදියරකදීම ඒවායේ සුරක්ෂාකාරී සහ තිරසර කළමනාකරණය සහතික කිරීම සහ සම්පත් පරිභෝජනය ප්‍රශස්ත කිරීම;

(ii) පුනර්ජනනීය හයිඩ්‍රජන් පරිසර පද්ධතියක සහ හරිත ආර්ථිකයක වර්ධනය සඳහා සහාය ලබාදිය හැකි මනාව පුහුණුව ලත් මානව සම්පත් සංචිතයක් කඩිනමින් මෙරට තුළින් හඳුනාගනු ලැබීම සම්බන්ධයෙන් සහතික කිරීම;

(iii) සුදුසු තොරතුරු කළමනාකරණ මෙවලම් යොදගැනීම මඟින් හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්න පිළිබඳ සුහුරු කළමනාකරණ ක්‍රමවේදයක් සහතික කිරීම;

(iv) ප්‍රත්‍යස්ථ (ඔරොත්තු දීමේ හැකියාව සහිත) ජාතික බලශක්ති පද්ධතියක් ඇති කරමින්, ශ්‍රී ලංකාවට සාධාරණ බලශක්ති සංක්‍රාන්තියක් සපුරාගැනීමේ හැකියාව සලසා දීම.

1. 4තර්කානුකූල පදනම

මූලික වශයෙන් පුනර්ජනනීය මූලාශ්‍රයන්ගෙන් නිෂ්පාදනය කරන්නා වූ හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්න විදුලිකරණය කිරීම අපහසු, එනම් බැර කර්මාන්ත සහ දිගු දුර ප්‍රවාහනය, රසායනික සහ වෙනත් කාර්මික ක්ෂේත්‍ර වැනි ක්ෂේත්‍රයන් කාබන්හරණය කිරීම සඳහා සුපිරිසිදු බලශක්ති වාහකයන් ලෙස යොදා ගැනීම, අනෙකුත් විකල්ප සීමාවට ලක් වන ප්‍රදේශ තුළ පොසිල ඉන්ධන වෙනුවට කාබන් අවම ඉන්ධන විකල්පයක් බවට පත් වී රටේ ශුද්ධ-ශුන්‍ය විමෝචන ඉලක්ක සපුරා ගැනීම පිණිස සැලකිය දායකත්වයක් ලබා දීම ශ්‍රී ලංකාවේ ජාතික හරිත හයිඩ්‍රජන් ප්‍රතිපත්තිය පිටුපස ඇති තාර්කික පදනම වේ. විවිධ ක්ෂේත්‍ර හරහා හරිත හයිඩ්‍රජන් නිෂ්පාදනය සහ භාවිතය ඉහළ නැංවීම මෙන් ම ගෝලීය වෙළඳපොළ වෙත අපනයනය කිරීම උදෙසා අවශ්‍ය වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙන් සහ වෙළඳපොළ දිරිගැන්වීම් ප්‍රවර්ධනය කිරීමෙන් මෙය සාක්ෂාත් කරගනු ලැබේ. මෙම ප්‍රතිපත්තිය හඳුන්වාදීම හරහා, ශ්‍රී ලංකාවේ හරිත හයිඩ්‍රජන් සංවර්ධනය උදෙසා වන ආයෝජන සඳහා හිතකර පරිසරයක් ස්ථාපිත කිරීම අරමුණු කෙරෙයි. අවසාන වශයෙන්, ශ්‍රී ලංකාව තුළ සුදුසු පරිදි යොදාගැනීම් සම්බන්ධයෙන් තීරණය කිරීමේදී තාක්ෂණික-ආර්ථික විද්‍යාත්ම කරුණු ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇත.

2.0 විෂය පථය

පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් උපයෝගී කරගනිමින් හයිඩ්‍රජන් සංවර්ධනය කිරීම සඳහා නීති හා ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම මෙම ප්‍රතිපත්තියේ අරමුණයි. ඒ අනුව, 'හරිත හයිඩ්‍රජන්' යනු පුනර්ජනනීය බලශක්තියෙන් හෝ ජෛව ප්‍රභවයන්ගෙන් ජනනය වන හයිඩ්‍රජන් ලෙස අර්ථ දැක්වෙන අතර, එහිදී නිකුත්වනු ඇති කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය 2% ටත් වඩා අඩු වනු ඇත.

3.0 මාර්ගෝපදේශකත්ව මූලධර්ම

ශ්‍රී ලංකාවේ ජාතික හරිත හයිඩ්‍රජන් ප්‍රතිපත්තිය:

- ශ්‍රී ලංකාව සඳහා හයිඩ්‍රජන් පරිසර පද්ධතියක් සහ අගය දාමයක් ස්ථාපිත කිරීමේ ආර්ථික විභවය හඳුනා ගනු ලබයි;
- තිරසර වූ සංවර්ධනයක් ප්‍රවර්ධනය කරන අතරවාරයේ දී ශ්‍රී ලංකාවේ ජනයාගේ සහ එහි පරිසරයෙහි සමෘද්ධිය සහ යහපැවැත්ම සම්බන්ධයෙන් ඇති වැදගත්කම හඳුනා ගනු ලබයි;

- පුනර්ජනනීය හයිඩ්‍රජන් පරිසර පද්ධතිය හා සම්බන්ධයෙන්, ධාරිතාවන් ගොඩනැඟීමේ, දැනුවත්භාවය ඇති කිරීමේ සහ අදාළ බලධාරීන් විසින් සුදුසු පර්යේෂණ සිදු කිරීමේ වැදගත්කම හඳුනා ගනු ලබයි;
- පුනර්ජනනීය හයිඩ්‍රජන් පරිසර පද්ධතියකට අනුවර්තනය වීමේ දී ඒ හා සම්බන්ධ විය හැකි අවදානම් හඳුනා ගනු ලබයි;
- අන්තර්ජාතික බලශක්ති නියෝජිතායතනය (IEA), අන්තර්ජාතික පුනර්ජනනීය බලශක්ති නියෝජිතායතනය (IRENA) සහ දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති රාමුව (UNFCCC) යනාදී, එහෙත් ඒවාට පමණක් සීමා නොවන අන්තර්ජාතික සම්මුතීන් සහ අන්තර්ජාතික සංවිධාන කෙරෙහි ඇති බැඳියාවන් සම්බන්ධයෙන් කැපවී කටයුතු කරන බවට යළි තහවුරු කරනු ලබයි;
- හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්න භාවිතයට අදාළව පුද්ගලික සෞඛ්‍ය හා සුරක්ෂිතතාව සහ පාරිසරික ප්‍රමිතීන්ට අනුකූල වීමේ වැදගත්කම හඳුනා ගනු ලබයි.
- චක්‍රීය භාවිතය සහතික කරමින්, අන්තරායකර ද්‍රව්‍ය/රසායනික ද්‍රව්‍ය අඩංගු හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්න නිෂ්පාදනය කිරීමේ සිට අවසානයේ බැහැර කිරීම දක්වා කළමනාකරණය කිරීමේ දී පාර්ශ්වකාර ආයතන අතර සමීප සම්බන්ධීකරණයේ ඇති වැදගත්කම හඳුනා ගනු ලබයි;
- ශ්‍රී ලංකාවේ හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතිය තුළ සෑම මට්ටමකින්ම සමානාත්මතාවය, සාධාරණත්වය, විවිධත්වය සහ අන්තර්ගතභාවය පවත්වාගෙන යාමේ ඇති වැදගත්කම හඳුනා ගනු ලබයි.

4.0 ප්‍රතිපත්ති ප්‍රකාශන

මෙරටට හයිඩ්‍රජන් හඳුන්වාදීම සම්බන්ධයෙන් අදාළ වන - ආර්ථිකය සවිබල ගැන්වීම, දැනුම උපයෝගී කර ගැනීම, ඵලදායී පරිසර පද්ධතියක්, ප්‍රවේසම සහ සුරක්ෂිතතාව, තාක්ෂණයේ ප්‍රමුඛතාව පවත්වාගැනීම යන මූලික පැතිකඩයන් යටතේ මෙම ප්‍රතිපත්ති ප්‍රකාශන හඳුනා ගනු ලැබේ:

4.1 ආර්ථිකය සවිබලගැන්වීම

4.1.1 තිරසර ආර්ථික ප්‍රතිලාභ

සෑම අදියරකදී ම මෙරට වෙත තිරසර ආර්ථික ප්‍රතිලාභ නියමාකාරයෙන් ලැබීම සහතික කරනු ලබමින්, ජාතික වශයෙන් වූ පුළුල් දෘෂ්ටිකෝණයක් තුළින් ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථික සංවර්ධනය සපුරාගැනීමෙහි ලා මෙරට තුළ පූර්ණ හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතියක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

4.1.2 බලශක්ති සුරක්ෂිතතාව, විමෝචනය අවම කිරීම සහ චක්‍රීය ආර්ථිකය

පුනර්ජනනීය බලශක්තිය මඟින් බලශක්ති සුරක්ෂිතතාව සපුරාගැනීම මෙන් ම චක්‍රීය ආර්ථික න්‍යායන් මඟින් මෙහෙයවනු ලබන කාබන් විමෝචනය අවම කිරීමේ ඉලක්ක, මෙරට තුළ හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතියක් සංවර්ධනය කිරීමෙහි ලා මූලික පරමාර්ථයන් වශයෙන් සලකනු ලැබේ.

4.2 දැනුම උපයෝගී කර ගැනීම

4.2.1 පර්යේෂණ සිදුකිරීම, නවෝත්පාදන සිදු කිරීම, දැනුම බිහිකිරීම සහ ප්‍රචාරණය කිරීම

පුද්ගල සෞඛ්‍ය හා ආරක්ෂාව සහ පාරිසරික තිරසරභාවය ඇතුළත් හයිඩ්‍රජන් පරිසර පද්ධතියක් සංවර්ධනය කිරීම, අවදානම් තක්සේරුව සිදුකිරීම, කළමනාකරණය කිරීම සහ සෑම මට්ටමකින් ම සන්නිවේදනය කිරීම කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කොට පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම නිර්මාණය කිරීමේ ප්‍රමුඛතා හඳුනාගනු ලබමින්, ඒ අනුව අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

4.2.2 නිපුණතා සංවර්ධනය කිරීම

හයිඩ්‍රජන්, එහි ව්‍යුත්පන්නයන් සහ සමස්ත පද්ධති මට්ටමින් වූ සියලුම සංරචක කළමනාකරණය කිරීම සහ ප්‍රවේශම්කාරීව හසුරුවනු ලැබීම සම්බන්ධයෙන් වන සියලුම අංශයන් හි නිපුණතාවන් අත්පත් කර ගැනීම සහ සංවර්ධනය කිරීම ප්‍රමුඛතාවයක් සේ සැලකෙනු ඇත. මීට අදාළව, පරිසර පද්ධතිය තුළ හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්නයන් කළමනාකරණය කිරීම සහ ප්‍රවේශම්කාරීව හසුරුවනු ලැබීමට අදාළව බහුපාර්ශ්වික ගිවිසුම් යටතේ ඇති කරගන්නා ලද බැඳීම් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ජාතික සහතිකකරණය: T1 දැනුවත්භාවය; T2 ක්‍රියාකරු/පළමු ප්‍රතිචාරකරු; T3 සැලසුම් ශිල්පී/පරීක්ෂක; T4 නියාමක/තක්සේරුකරු යනුවෙන් ස්ථර වශයෙන් වූ ජාතික සහතිකකරණයක් (tiered national credential) ස්ථාපිත කෙරෙනු ඇත. සෑම ස්ථරයක්ම ඉගෙනුම් ප්‍රතිඵල, අවම ඉගැන්වීම් පැය ප්‍රමාණය, ප්‍රායෝගික අභ්‍යාස සහ අවුරුදු 3කට වරක් නැවත සහතික කිරීමේ චටයකින් සමන්විත වේ. පුහුණුව සපයන්නන් ප්‍රතීතනය (accredited) කරනු ලැබේ; ජාත්‍යන්තර සහතිකකරණය සහිත ඒවාට වෙනත් රටවලදී ද පිළිගැනීම ලබා දෙනු ලැබිය හැකිය.

4.2.3 තොරතුරු ව්‍යාප්ත කිරීම

හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතිය පිළිබඳ සෑම මට්ටමකින්ම වූ අදාළ තොරතුරු ආයතනික ව්‍යුහය හරහා ව්‍යාප්ත කරලීම ජාතික නීති රාමුව තුළ හැකි උපරිම මට්ටමක් කරා සිදුකරනු ලබන බව සහතික කරනු ලැබිය යුතු ය.

4.2.4 පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය

තීරණවලට එළැඹීමේ සහ ක්‍රියාත්මක කිරීමේ මට්ටම්වලදී පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහතික කරලීම සඳහා මහජන දැනුවත්භාවය, අධ්‍යාපනය, ධාරිතාව ගොඩනැගීම සහ තාක්ෂණික සහයෝගීතාව සහ දැනුම හුවමාරුව හා ප්‍රශස්ත භාවිතයන් ප්‍රවර්ධනය කරනු ලැබේ.

4.3 ඵලදායී පරිසර පද්ධතියක්

4.3.1 ක්‍රියාත්මක කිරීමේ ආයතනය

මෙරට හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතිය නියාමනය සඳහා නම් කෙරෙන විශේෂිත ආයතනය බවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පත් වනු ඇත. මෙය සාක්ෂාත් කර ගැනීම උදෙසා නිසි ලෙස අධිකාරිය වෙත බලය පැවරීම පිණිස ,අවශ්‍ය වුවහොත්, පනතට සංශෝධන හඳුන්වා දීමට මූලික මැදිහත්වීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ .මීට අදාළව, බලශක්ති වාහකයක් ලෙසින් පුනර්ජනනීය බලශක්ති පාදක විදුලිය නියාමනය කරනු ලැබීම සඳහා අධිකාරිය සතුව දැනට පවතින විෂය සීමාව, නව බලශක්ති වාහකයක් ලෙසින් හරිත හයිඩ්‍රජන් නියාමනය කිරීමේ බලය ද පවරනු ලබමින් සුදුසු පරිදි පුළුල් කිරීම සිදු කෙරෙනු.ඇත

> *සටහන: ඉහත සඳහන් කරුණු, ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද නිර්දේශය සමඟින් අනුකූල වන්නේ ය. පාරිසරික ගැටළු හෝ ආරක්ෂාව සම්බන්ධයෙන් ජාතික පරිසර පනතට අදාළව කටයුතු කළ යුතුය.*

4.3.2 මෙහෙයුම් කමිටුව සහ විශේෂඥ කමිටුව

මෙම ප්‍රතිපත්තිය සම්මත කර ගැනීම අධීක්ෂණය කිරීම පිණිස මෙහෙයුම් කමිටුවක් හෝ පාලම ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු වන අතර, මෙම ප්‍රතිපත්තිය සම්මත කර ගැනීමේ ක්‍රියාවලිය

අතරේදී, විෂය සම්බන්ධයෙන් විශේෂඥ අදහස් ලබාගැනීමට මෙහෙයුම් කමිටුවට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා විශේෂඥ කමිටුවක් කැඳවීම සිදුකරනු ලැබිය යුතුය.

4.3.3 නෛතික සහ ආයතනික රාමු

විෂයට අදාළ පනත් සැලකිල්ලට ගනු ලබමින්, වඩාත් සුදුසු නෛතික සහ ආයතනික රාමු තුළ නිරවුල් අයුරින් වගකීම් බෙදා දැක්වීම හරහා අදාළ නීති, රෙගුලාසි, මාර්ගෝපදේශන සහ ප්‍රමිතීන් ඵලදායීව බලාත්මක වීම සහ ක්‍රියාත්මක වීම සහතික කෙරෙනු ඇත.

1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 වන වගන්තිය, 2000 අංක 53 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත සහ 2026 අංක 15 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත හා අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

- 1993.06.24 දිනැති අංක 772/22 දරන ගැසට් නිවේදනය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගය - පාරිසරික බලපෑම් තක්සේරු පරීක්ෂණය (EIA)
- 2022.01.27 දිනැති අංක 2264/18 දරන ගැසට් නිවේදනය - පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL)
- අංක 924/12 දරන ගැසට් නිවේදනය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 1 දරන ජාතික පාරිසරික (ශබ්ද පාලන) රෙගුලාසි 1996-05-21
- 2008.02.01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රය සහ 2009.11.10 දිනැති අංක 1627/19 දරන ගැසට් පත්‍රය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මූලික රෙගුලාසි - උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර (SWML).

හයිඩ්‍රජන් කර්මාන්තයේ නියාමක වශයෙන් කටයුතු කරනු ඇති ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ද, නිෂ්පාදන ස්ථාන, ගබඩා පහසුකම් සහ ප්‍රවාහන යටිතල පහසුකම් ඉහළ ආරක්ෂාවකින් සහ ගුණාත්මක ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා වගකීම දරනු ඇත.

මහජන පරිභෝජනයට සුදුසු හයිඩ්‍රජන් නිෂ්පාදන සහ ඒවායේ අතුරු නිෂ්පාදන සම්බන්ධයෙන් වන නියාමක වශයෙන් කටයුතු කරනු ඇති ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සුරක්ෂිතබව, ගුණාත්මකබව සහ අදාළ ප්‍රමිතීන් සහ රෙගුලාසිවලට අනුකූල වීම අධීක්ෂණය කරනු ඇත.

4.3.4 ආයතන සම්බන්ධීකරණය

මෙම ප්‍රතිපත්තිය ඵලදායී අයුරින් ක්‍රියාත්මක වීම සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් අදාළ සියලුම රාජ්‍ය ආයතන සහ පෞද්ගලික සංවිධානයන් හි ඵලදායී සම්බන්ධීකරණය තහවුරු කරමින් කටයුතු කරනු ලැබේ.

4.3.5 අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම විධිමත්ව අධීක්ෂණයට ලක්කිරීම සඳහා පිටුබලය ලබාදීම මෙන්ම ආයතනගත කිරීම අති නවීන ප්‍රවණතා සහ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය සුදුසු කාල පරතරයන් හි දී සමාලෝචනය කිරීම සිදු කරනු ලැබේ. අධීක්ෂණ සහ සමාලෝචන ක්‍රියාවලියේ දී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව ඇගයීම, නියාමන අනුකූලතාව සහ මතුවෙමින් පවතින අවදානම් හඳුනා ගැනීම සම්බන්ධයෙන් දැඩිව සලකා බලනු ලැබේ.

4.4 ප්‍රවේසම සහ සුරක්ෂිතතාව

4.4.1 පුද්ගලික සෞඛ්‍ය සහ ආරක්ෂාව

පුද්ගලික සෞඛ්‍ය සහ ආරක්ෂාව සහතික කරලීම සහ ජෛව විවිධත්වය සහ ජෛව පද්ධති ඇතුළු පරිසරය ආරක්ෂා කිරීම සඳහා හයිඩ්‍රජන්, එහි ව්‍යුත්පන්නයන් සහ හයිඩ්‍රජන් යටිතල පහසුකම් කළමනාකරණය කිරීම සහ ප්‍රවේශම්කාරීව හසුරුවනු ලැබීම සම්බන්ධයෙන් වන උපාය මාර්ග සහ ක්‍රියාමාර්ග ශක්තිමත් කෙරෙනු ඇත.

4.4.2. ප්‍රමිති සහ රෙගුලාසි

අති නවීන ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට, ආරක්ෂණ කේත, මිශ්‍රණ කෝටාවන් යනාදියට අනුරූපව රෙගුලාසි බලාත්මක කිරීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, ඉහළ ප්‍රමුඛතාවක් සේ සලකා ශ්‍රී ලංකාව විසින් ඒ සඳහා සුවිශේෂී වැදගත්කමක් ලබා දෙනු ලැබිය යුතුය. මීට අදාළව, විශේෂයෙන් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන්, සුදුසු බලධාරී ආයතන වෙත කාර්යයන් සහ වගකීම් නිරවුල්ව පවරා දීම ඉහළ ප්‍රමුඛතාවයක් බවට සලකනු ලැබේ

ආරක්ෂණ ක්‍රමවේදය (Safety Case Regime): අවදානම් හඳුනාගැනීම (HAZID), ප්‍රමාණාත්මක අවදානම් තක්සේරුව (QRA) සහ විසිරුවා හැරීම/සුරක්ෂිතව වායු මුදාහැරීම (dispersion/venting) සඳහා අවශ්‍ය කෙරෙන විටක දී, වලංගු සංඛ්‍යාත්මක තරල ගති විද්‍යාත්මක (CFD) විශ්ලේෂණ ක්‍රමයක් ඇතුළත් කරමින් අනුමත ආරක්ෂාව සම්බන්ධ ක්‍රමවේදයක් (approved Safety Case) ඉදිරිපත් කිරීමට I/II පන්තියේ හයිඩ්‍රජන් බලාගාර කටයුතු කළ යුතුය. ආරම්භයේදීම සහ අවම වශයෙන් සෑම මාස 36කට වරක් මෙම ආරක්ෂිත ක්‍රමවේදය ස්වාධීනව සමාලෝචනය කළ යුතුය.

අත්පොත් (Playbooks) නිකුත් කිරීම සහ විගණන සැලැස්ම (Audit Cadence) සඳහා අවසර ලබා දීම: විද්‍යුත් විච්ඡේදක; ගබඩා කිරීම (සම්පීඩිත/ද්‍රව); නල මාර්ග; ඉන්ධන පිරවුම්හල්; සහ අපනයන පර්යන්ත (නැව්වලට ඇමෝනියා ඉන්ධන සැපයීම (ammonia bunkering) ඇතුළුව) පිළිබඳව වත්කම් කාණ්ඩයේ අත්පොත් ප්‍රකාශයට පත් කිරීමට වගකිව යුතු අධිකාරිය විසින් කටයුතු කළ යුතුය. අවශ්‍ය අධ්‍යයන, බාධක (පසුබෑම්), අනතුරුදායක ප්‍රදේශ වර්ගීකරණය, හඳුනාගැනීම/ හදිසි වසා දැමීම් (ESD), වාතාශ්‍රය, විදුලිය පිළිබඳ, ගින්නෙන් ආරක්ෂාව, මෙහෙවරෙහි යෙදවීම සහ හදිසි ආරක්ෂක අභ්‍යාස යනාදිය අත්පොත් තුළට ඇතුළත් වනු ඇත. පිරික්සුම් සැලැස්ම (Inspection cadence): I පන්තිය: වාර්ෂිකව ස්වාධීනව විගණනය සිදුකිරීම වසර + 3කින් ආරක්ෂණ ක්‍රමවේදයේ වලංගුභාවය නැවත තහවුරු කරගැනීම (Safety Case re‑validation); II පන්තිය: ද්විවාර්ෂිකව විගණනය සිදුකිරීම වසර + 5කින් සමාලෝචනය කිරීම සිදු කළ යුතුය.

4.4.3 අවදානම් කළමනාකරණය කිරීම

අවදානම් විශ්ලේෂණය කිරීම, අවදානම් තක්සේරු කිරීම, අවදානම් අවම කරමින් කළමනාකරණය කිරීම සහ සන්නිවේදනය කිරීම සෑම මට්ටමකින්ම ශක්තිමත් කෙරෙනු ඇත. මෙහිදී, සමස්ත දිවයින ම (අක්වෙරළ පහසුකම් සහ අපනයන පර්යන්ත ඇතුළුව) ආවරණය වන පරිදි හදිසි ප්‍රතිචාර ජාලයක් දැනට පවතින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සම්බන්ධ කරමින් ස්ථාපිත කරනු ලැබෙන අතර, සුදුසු පුහුණු කාර්ය මණ්ඩලයක් සහ අවශ්‍ය අනෙකුත් සියලුම සම්පත් ඒ සඳහා වෙන් කෙරෙනු ඇත.

4.5 තාක්ෂණයේ ප්‍රමුඛතාව

4.5.1 මෙවලම් සහ තාක්ෂණයන්

හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතියක් මෙන් ම සෑම මට්ටමකින්ම එහි තිරසර මෙහෙයුම් ක්‍රියාකාරිත්වයක් ඇති කිරීම සඳහා සුදුසු අති නවීනතම මෙවලම්, උපකරණ හා තාක්ෂණයන් භාවිතයට ගනිමින් හයිඩ්‍රජන් තාක්ෂණයන් තිරසර අයුරින් ප්‍රයෝජනයට ගැනීම සිදුකරනු ලැබිය යුතු ය.

4.5.2 දත්ත කළමනාකරණ පද්ධතිය

වත්කම් ලැයිස්තුව, බලපත්‍ර සහ පිරික්සුම් තත්ත්වය, නිෂ්පාදනය/උත්පාදනය, සිදුවීම්/ආසන්න අතපසුවීම් (near-miss reporting) වාර්තාකරණය, ප්‍රධාන කාර්යසාධන දර්ශක පුවරු (KPI dashboards) සහ ජීව චක්‍ර ඇගයුම්/ අජෛවීය ප්‍රභවයේ පුනර්ජනනීය ඉන්ධන (LCA/RFNBO) ලෙජර පවත්වාගෙන යාම සඳහා ජාතික හයිඩ්‍රජන් දත්ත වේදිකාවක් ක්‍රියාත්මක කරනු ලැබේ. ක්‍රියාකරුවන් විසින් මෙහෙයුම් දත්ත සැපයීම මාසිකව සිදු කළ යුතුවේ; ප්‍රධාන කාර්යසාධන දර්ශක ප්‍රකාශයට පත් කිරීම කාර්තුමය වශයෙන් සිදු කරනු ලැබේ.

5.0 ප්‍රතිපත්ති ඉලක්ක

බලශක්ති සංක්‍රාන්තිය සම්පූර්ණ කරවන තුන්වන බලශක්ති වාහකයා බවට හරිත හයිඩ්‍රජන් පත් කරවමින් ශ්‍රී ලංකාව ප්‍රමුඛ මට්ටමේ බලශක්ති අපනයනකරුවෙකු කරලීම ප්‍රතිපත්ති ඉලක්කය බවට පත්ව තිබෙයි.

6.0 ප්‍රතිපත්තියේ අදාළත්වය

හරිත හයිඩ්‍රජන් සහ හයිඩ්‍රජන් ව්‍යුත්පන්න සුවිශේෂිත වූ අවස්ථාවල යොදාගැනීමේ සිට සුරක්ෂිතතාව සහතික කරමින් පුළුල් ලෙස භාවිතයට ගැනීම දක්වා වූ පරිවර්තනයක් සිදුවන විට මතු වන බාධක මඟහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හරිත හයිඩ්‍රජන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මඟින් කළමනාකරණ කාර්යරාමුවක් ස්ථාපිත කරනු ලබයි.

ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන් දැඩිව අනුගමනය කිරීම මඟින් බලශක්ති පද්ධතිය තුළ සෑම අංශයකදීම ප්‍රවේසම්කාරී අයුරින් හයිඩ්‍රජන් හසුරුවනු ලැබීම සහතික කෙරෙන්නා වූ ශක්තිමත් ක්‍රියාවලියක් පිළිබඳව මෙම ප්‍රතිපත්තිය මඟින් නිර්දේශ කරනු ලබයි. හයිඩ්‍රජන් ආශ්‍රිත සියලුම ආරක්ෂක විධිවිධාන සහ අවදානම් තක්සේරු කිරීම් නවීන අන්තර්ජාතික ප්‍රශස්ත භාවිතයන්ට අනුරූපව නිතිපතා සමාලෝචනය කරනු ලැබිය යුතු බව ද එමඟින් අවධාරණය කරනු ලබයි. පර්යේෂණ හා සංවර්ධනයන් තුළින් උකහා ගත් නව දත්ත, තොරතුරු සහ සිද්ධි අධ්‍යයනයන්, සිදුවීම් ආශ්‍රිත නව සොයාගැනීම්/උගත් කරුණු ඇතුළත් කරමින්, ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතියේ සියලුම ක්‍රියාවලීන් ඇතුළුව හයිඩ්‍රජන් ක්ෂේත්‍රය පුරා කාර්යක්ෂම වූ සන්නිවේදන මාර්ගයක් පවත්වා ගෙන යාමට ද එමඟින් යෝජනා කරනු ලබයි.

ජාතික බලශක්ති ප්‍රතිපත්තිය, ජාතික රසායනික ද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා ප්‍රතිපත්තිය, දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික පරිසර ප්‍රතිපත්තිය ඇතුළු අනෙකුත් ජාතික හා ආංශික ප්‍රතිපත්ති සහ රෙගුලාසි සමඟින් ශ්‍රී ලංකාවේ ජාතික හරිත හයිඩ්‍රජන් ප්‍රතිපත්තිය අනුපූරක වේ. හරිත-මෙතනෝල්, හරිත-ඇමෝනියා සහ තිරසර ගුවන් යානා ඉන්ධන (SAF) වැනි හරිත හයිඩ්‍රජන් ඇතුළත් හරිත නිෂ්පාදන සඳහා පසුභාග වෙළඳපොළවල් (downstream markets) සංවර්ධනය කිරීම උදෙසා මෙම ප්‍රතිපත්තිය මඟින් මඟපෙන්වනු ලබයි. ඉහත ලැයිස්තුගත කළ ඒවා ද ඇතුළුව හයිඩ්‍රජන් සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර අනෙකුත් ජාතික ප්‍රතිපත්ති සමඟ අනුගතව පවත්වාගෙන යාම සඳහා වූ නීතිමය පදනම ද එමඟින් සකසනු ලබයි.

හරිත හයිඩ්‍රජන් සම්බන්ධ වූ අගය දාමයක් සහ ඊට අදාළව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය මූල්‍යමය දිරිගැන්වීම් සහ මූල්‍යමය නොවන විධිවිධාන පෞද්ගලික අංශයේ ආයෝජකයින් වෙත සම්පාදනය කර දෙනු ලැබීම සඳහා රජය විසින් සැලකිය යුතු ක්‍රියාමාර්ග ගනිමින් පසු වේ.

ආනයන තීරුබදු සහන, හිතකර වූ බදු අයකිරීම්, සරල කාර්යපටිපාටි (උදා: සංවර්ධන සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය සඳහා වූ කේන්ද්‍රගත ආයතනයක් පවත්වාගෙන යාම), විශේෂ ආර්ථික කලාපීය සහය, කේන්ද්‍රගතව සම්බන්ධීකරණය කෙරෙනු ඇති අනුමත කිරීමේ ක්‍රියාවලිය, දේශීයව නිෂ්පාදනය කරන කොටස් යොදාගැනීම සම්බන්ධයෙන් සහනාධාර ලබාදීම් යනාදි වශයෙන් වුත්, ඒවාට පමණක් නිශ්චිතව සීමා නොවනු ඇති වුත් කරුණු මීට ඇතුළත් වනු ඇත. හරිත හයිඩ්‍රජන් පිළිබඳ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම හඳුන්වා දෙනු ලැබීම, පාරිසරික සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවයේ අනුකූලතාව සහතික කිරීම සඳහා අවශ්‍ය කාර්යරාමු ස්ථාපිත කිරීම යන ඒවාට පමණක් සීමා නොවන්නා වූ පියවර අනෙකුත් ක්‍රියාමාර්ග අතරට ඇතුළත් වනු ඇත. මේවා සඳහා දේශීය හා විදේශීය පාර්ශ්වකරුවන් සහ සංවිධාන සම්බන්ධ කරගනිමින්, බහුපාර්ශ්වික ගිවිසුම් (MAs) සහ අවබෝධතා ගිවිසුම් (MoUs) සකස් කරනු ලැබීම අවශ්‍යව පවතී. මෙම ප්‍රතිපත්තිය මඟින් බහුපාර්ශ්වික ගිවිසුම් සකස් කිරීම සඳහා වූ මාර්ගෝපදේශකත්වය මෙන් ම ඒවා ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා ශක්තිමත් ක්‍රියාවලියක් සම්පාදනය කරනු ලබයි.

7.0 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග

ශ්‍රී ලංකාවේ ජාතික පුනර්ජනනීය හයිඩ්‍රජන් ප්‍රතිපත්තිය තුළ පහත සඳහන් උපාය මාර්ග දක්වා ඇත:

වසර 2030 වන විට ශ්‍රී ලංකාව තුළ හරිත හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්න නිෂ්පාදනය ඉහළ නංවනු ලැබීම හා හරිත හයිඩ්‍රජන් ආර්ථිකයක් කරා අත්තිවාරම් සකස් කිරීම සඳහා වූ උපාය මාර්ග;

මෙරට තුළ හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතියක් සංවර්ධනය කරලීම සඳහා වූ ආයෝජන දිරිගැන්වීමේ මාර්ග;

දේශීය හා විදේශීය වෙළඳපොළවල් සඳහා අති නවීන උපකරණ සහ කොටස් නිෂ්පාදනය කිරීම සහ පද්ධති සංවර්ධනය කිරීම පිණිස ශ්‍රී ලංකාව තුළ හැකියාව පවතින බව තහවුරු කිරීම සඳහා අන්තර්ජාතික හවුල්කරුවන්/සමාගම් සමඟ තාක්ෂණික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කරනු ලැබීම සඳහා වූ උපාය මාර්ග.

නවෝත්පාදනය සඳහා සහය වන්නා වූ ද, දේශීය සැපයුම් දාමය සංවර්ධනය කිරීම සඳහා ආයෝජන දිරිගන්වනු ලබන්නා වූ ද, අගය දාමයෙහි සෑම මට්ටමකදීම අවශ්‍ය කෙරෙන නිපුණ ශ්‍රම බලකාය පුහුණු කරනු ලබමින් මෙන් ම ශ්‍රී ලංකාව වෙත අපනයන අවස්ථා සලසා දෙනු ලබන්නා වූ ද මෙම ප්‍රතිපත්තිය යටතේ හයිඩ්‍රජන් ආර්ථිකයක අපේක්ෂිත වර්ධනයේ ආර්ථික ප්‍රතිලාභ අත්පත් කරගැනීම සහ ස්ථිරසාරව පවත්වාගෙන යාම උදෙසා වූ උපාය මාර්ග ද සම්පාදනය කරනු ලබයි.

7.1 අනුකූලතාව, ධාරිතාව ගොඩනැංවීම සහ මහජන පිළිගැනීම

අනුකූලතාව, ධාරිතාව ගොඩනැංවීම සහ මහජන පිළිගැනීම අංශ යටතේ එන උපාය මාර්ග මෙසේය:

1. හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතිය තුළ හයිඩ්‍රජන්, ව්‍යුත්පන්නයන් සහ ඒ හා ආශ්‍රිත සියලුම අංගයන් නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, අන්තර්-පරිවර්තනය කිරීම, භාවිතයට ගැනීම, අපනයනය කිරීම සහ සුරක්ෂිතව වාතනය/බැහැර කිරීම රටේ නීති සහ අන්තර්ජාතික සම්මුතීන් මෙන්ම අනෙකුත් එකඟතාවට පැමිණ ඇති ප්‍රතිපත්ති, නීති සමුදායන් (ප්‍රොටෝකෝල) සහ ක්‍රියාපිළිවෙත් (උදා: දැනුම හුවමාරුව සහ ප්‍රශස්ත භාවිතයන්, සුනිත්‍යභාවය) සමඟ අනුකූල වන බවට සහතික කිරීම. මෙම සන්දර්භය තුළ, සෞඛ්‍ය සහ ආරක්ෂක පිළිවෙත් (විධිමත් ස්වයං තක්සේරු පිළිවෙත්, මිණුම් සලකුණු සහ ආරක්ෂක අභ්‍යාස ආදිය) දැඩිව අනුගමනය කිරීම ඇතුළුව එනමුත් ඒවාට සීමා නොවන යාවත්කාලීන ජාත්‍යන්තර රෙගුලාසි සහ ප්‍රමිතීන් සමඟ ජාතික රෙගුලාසි සහ ප්‍රමිතීන් අනුරූප වන සේ

විධිමත් කළ යුතුය. සුදුසු ඕනෑම අවස්ථාවකදී, අන්තර්ජාතික රෙගුලාසි රටේ දේශීය අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් අදාළ කරගැනීම සිදුකෙරෙනු ඇත;

2. හයිඩ්‍රජන් සහ ව්‍යුත්පන්න නිෂ්පාදනය සංවර්ධනය කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම් පාරිභෝගික මධ්‍යස්ථාන, විශේෂයෙන් ම පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ස්ථාන, ප්‍රධාන කාර්මික කලාප සහ කර්මාන්ත තුළ අන්‍යොන්‍ය වශයෙන් වාසි උදා කරගත හැකි රසායනික සහජීවනය (industrial chemical symbiosis) ප්‍රවර්ධනය කෙරෙන අපනයන පර්යන්තවලට (කර්මාන්ත සමූහ පිහිටීම් තුළ) ආසන්නව මූලික වශයෙන් ස්ථාන හඳුනා ගනු ලැබීම. මෙම ගබඩා මධ්‍යස්ථාන/සමූහ මගින් හයිඩ්‍රජන් ගබඩා කර කාර්යක්ෂමව බෙදා හැරීම තහවුරු කෙරෙනු ඇති අතර දේශීය හා අපනයන ඉල්ලුම සපුරාලීම ද හයිඩ්‍රජන් සැපයුම් දාමය ජාත්‍යන්තර ප්‍රශස්ත ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූලව සහ චක්‍රාකාර හරිතාගාර වායු විමෝචන (Scope 3 emissions) අවම කිරීම ද සහතික කරනු ඇත;

3. පර්යේෂණ සහ සංවර්ධනය, නවෝත්පාදනය සහ දැනුම බිහි කිරීම (කර්මාන්ත-විශ්ව විද්‍යාල-රජයේ අන්තර්ක්‍රියාකාරකම්/හවුල්කාරිත්වයන් හරහා), සියලු මට්ටම්වලින් අවශ්‍ය කෙරෙන කුසලතා පුහුණු කිරීම, ධාරිතාව ගොඩනැගීම, නිපුණතා වර්ධනය වැනි මානව සම්පත් සංවර්ධනය කිරීම, හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතියේ සියලුම පාර්ශවකරුවන් සමඟ ප්‍රශස්ත භාවිතයන් සමඟ දැනුම බෙදා හදා ගැනීම ප්‍රවර්ධනය කිරීම;

4. හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා සෑම මට්ටමකින්ම අවශ්‍ය කෙරෙන සෞඛ්‍ය සහ ආරක්ෂණ පුහුණුව ඇතුළත් තාක්ෂනික කුසලතා මෙන්ම තාක්ෂණික නොවන කුසලතා (උදා: හරිත ව්‍යාපාර ආකෘති, සැපයුම් දාම කළමනාකරණය, ජීව චක්‍ර තක්සේරුව, ප්‍රතිචක්‍රීකරණය සහ චක්‍රීයභාවය, කාබන් විමෝචනය අවම කිරීම අරමුණු කරගත් බලපෑම අවම කරන හානිපූරණ ස්වභාවයේ ක්‍රියාමාර්ග (carbon offsetting)) පුළුල් කිරීම සඳහා යටිතලව්‍යුහ, පහසුකම් සහ විශේෂඥ කාර්ය මණ්ඩලයක් ලබා දෙමින් පුහුණු ආයතන සවිබල ගැන්වීම;

5. දැනට ඇති පරීක්ෂණ පහසුකම් සවිබල ගැන්වීම සහ හයිඩ්‍රජන් (වායුමය සහ ද්‍රව හයිඩ්‍රජන් යන දෙකම) සහ එහි ව්‍යුත්පන්නවල ගුණාත්මකභාවය විශ්ලේෂණය සහ සහතික කිරීම සඳහා ජංගම පරීක්ෂණ පහසුකම් ඇතුළුව, විසිරි ඇති මට්ටමින් නව පරීක්ෂණ පහසුකම් ස්ථාපිත කිරීම, එමඟින් හයිඩ්‍රජන් තාක්ෂණය භාවිතයට ගැනීම කඩිනම් කිරීම සඳහාත් දේශීය වශයෙන් භාවිතයට ගැනීමටත් අපනයනය කිරීමටත් සහාය සැලසීම.

6. හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධති සඳහා අවශ්‍ය උපකරණ (උදා: වායු වර්ණලේඛන උපකරණ, විද්‍යුත් රසායනික උපකරණ පද්ධති), උපාංග (උදා: විද්‍යුත් විච්ඡේදක, ඉන්ධන කෝෂ, සම්පීඩක), කොටස් (උදා: පයිප්ප, රෙගියුලේටර, සවිකුරු, සංවේදක) දේශීයව නිෂ්පාදනය කිරීමේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම සහ අනුග්‍රහය ලබාදීම.

7. පුනර්ජනනීය හයිඩ්‍රජන් උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම සකස් කොට, එය හඳුන්වා දෙනු ලැබීම.

8. ඔවුන්ගේ ජාතිය, සමාජ-ආර්ථික තත්ත්වය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අනෙකුත් නෛසර්ගික ලක්ෂණ පිළිබඳ නොතකා, හයිඩ්‍රජන්, එහි ව්‍යුත්පන්නයන් සහ අන්තරායයන් සහිත ඒ ආශ්‍රිත නිෂ්පාදන ගෘහස්ථ භාවිතය පිළිබඳව සියලුම පාර්ශවකරුවන්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම;

9. හයිඩ්‍රජන් තාක්ෂණයන් ආරක්ෂාකාරිව භාවිතයට ගැනීම සහ එහි වාසි හා අභියෝග සම්බන්ධයෙන් මහජනයා අතර ප්‍රචලිත කරවීම සහ පිළිගැනීම ඇති කරවීම සඳහා සහාය සැලසෙන පරිදි එම තොරතුරු ජනමාධ්‍ය සහ සියලුම ආකාරයේ සන්නිවේදන මාර්ග හරහා ප්‍රචාරණය කරලීම සඳහා ජනමාධ්‍යවේදීන්/මාධ්‍ය සේවකයින් උනන්දු කරවීම සහ ප්‍රතිලාභ සමඟින් දිරිමත් කිරීම.

7.2 කළමනාකරණය, වගකීම සහ අධිකාරිය

කළමනාකරණය, වගකීම සහ අධිකාරිය අංශ යටතේ එන උපාය මාර්ග මෙසේය:

1. ශ්‍රී ලංකාව තුළ හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ජාතික හා අන්තර්ජාතික මට්ටමින් වූ සියලුම වගකිවයුතු ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධාන සහ පුද්ගලයින් සම්බන්ධීකරණය කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත බලය පවරනු ලැබීම;

2. ක්‍රියාවට නැංවීම, කළමනාකරණය, සියලු උපද්‍රව හඳුනා ගැනීම, අවදානම් තක්සේරු අනුකූලතාව (ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව), පාරිසරික තිරසරභාවය, අධීක්ෂණය (උදා: මෙහෙයුම් ක්‍රියාකාරිත්වය, තත්‍ය කාලීන හයිඩ්‍රජන් ප්‍රවාහය) සහ හයිඩ්‍රජන් පරිසර පද්ධතියට අදාළ යාවත්කාලීන කරුණු සන්නිවේදනය කිරීම සහ වාර්තාකිරීම සහතික කෙරෙන පරිදි අති නවීන වඩාත්ම සුදුසු මෙවලම් සහ උපකරණ උපයෝගී කරගැනීම.

3. ශ්‍රී ලංකාවට සිය බලශක්ති සුරක්ෂිතභාවය සාක්ෂාත් කරගැනීමට සහ කාබන් විමෝචනය අවම කරගැනීමේ ඉලක්ක වෙත ළඟා වීමට හැකියාව සැලසෙන පරිදි, සෑම ක්‍රියාවලියක් මුළුල්ලෙහිම කඩිනමින් තීරණ ගැනීමට හැකි කරවන්නා වූ ශක්තිමත් යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම:

4. හරිත හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්න නිෂ්පාදනය සහ ගබඩා කෙරෙන ස්ථාන, ප්‍රවාහනය, සැපයුම් දාමය සහ අපනයනය සඳහා වූ ආයෝජන සඳහා අනුමත කිරීමේ ක්‍රියාවලීන් කඩිනම් කිරීම උදෙසා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම;

5. වඩාත් පුළුල් වූ ජාතික මුදල් ප්‍රතිපත්තියක් සමඟින් අනුකූල වූ සහය සලසන්නා වූ මූල්‍යමය හා නියාමන පරිසරයක් සැකසීම;

6. ඕනෑම හරිත හයිඩ්‍රජන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙරට පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ 18 වන වගන්තියට අනුකූලව බලශක්ති බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය සහතික කිරීම;

7. සුදුසු ව්‍යාපාර ආකෘති හරහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) මඟින් හරිත හයිඩ්‍රජන් නිෂ්පාදන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාවට නැංවීම සඳහා පහසුකම් සැලසීම. මෙම ආකෘති මගින් මෙරට තුළ මහා පරිමාණ හරිත හයිඩ්‍රජන් නිෂ්පාදනය, සැපයුම් දාමය සහ පාරිභෝගික ව්‍යාපෘති සඳහා දේශීය හා අන්තර්ජාතික යන පෞද්ගලික සමාගම් දෙපාර්ශවයටම සහභාගී වීමේ හැකියාව තහවුරු කෙරෙනු ඇති අතර, ශ්‍රී ලංකාව වෙත ආර්ථික ප්‍රතිලාභ හිමිකරදීමට සමත් වනු ඇත.

8. 5R ක්‍රමවේදය, චක්‍රීය ආර්ථිකය සහ නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම් ගෙවුම් මූලධර්මය (extended producer responsibility pay principle) පදනම් කරගනිමින් ඉදිකිරීම, නිෂ්පාදනය, භාවිතය, අලුත්වැඩියාව හා නඩත්තු සහ යන්ත්‍රෝපකරණ හා උපාංගවල ආයු කාලය

අවසන්වීම යන අදියරයන්හි දී නිෂ්පාදන ස්ථාන සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ යාන්ත්‍රණයන් හඳුන්වා දීම.

9. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හරහා අවශ්‍ය නීති සහ රෙගුලාසි සකස් කර ක්‍රියාත්මක කරනු ලැබීම මගින් අත්‍යවශ්‍ය ප්‍රජා සහ පාරිසරික අවශ්‍යතාවන්ට බාධාවක් නොවන පරිදි ඉඩම් සහ ජල සම්පත් වගකීමෙන් යුතුව පරිහරණයට ගැනීම සහතික කිරීම.

7.3 අධීක්ෂණය සහ ඇගයීම

අධීක්ෂණ සහ ඇගයීම් අංශ යටතේ ඇති උපාය මාර්ග මෙසේය:

1. සියලුම මට්ටම්වල ක්‍රියාකරුවන් සහ භාවිත කරන්නන් අති නවීනතම කාර්යපටිපාටි, නීති සමුදායන් (ප්‍රොටෝකෝල) සහ ක්‍රියාපිළිවෙත් හා අනුකූලව කටයුතු කරන බවට නිතිපතා පිරික්සා බැලීම, අනුබල ලබාදීම සහ තහවුරු කිරීම සඳහා අවශ්‍ය විශේෂඥ දැනුමෙන් සන්නද්ධ විශේෂඥ කණ්ඩායමක් විසින් මෙහෙයවනු ඇති ක්‍රියාකාරී පද්ධතියක් ඒකාබද්ධ වත්කම් පරීක්ෂා කිරීම සඳහා ස්ථාපිත කිරීම;

2. සියලුම පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව පරිසර පද්ධතිය සිදුවන හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්න සැපයුම් ප්‍රවාහය තත්‍ය කාලීනව අධීක්ෂණය කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී දත්ත ගබඩාවක් හඳුන්වා දෙනු ලැබීම සහ විධිමත් රහස්‍යභාවයකින් යුතුව දත්ත කළමනාකරණය කිරීම සඳහා ප්‍රධාන යාන්ත්‍රණයක් සකස් කිරීම;

3. නවීන අන්තර්ජාතික දැනුම, ප්‍රශස්ත ක්‍රියාපිළිවෙත්, සිදුවීම් පිළිබඳ අවබෝධය, සිදුවීම්වලින් උගත් දෑ, දැනුම හුවමාරුව පිළිබඳ යාවත්කාලීන තත්ත්වයන් දැනුවත් වීමට හැකියාවන ලැබෙන පරිදි මෙරට හයිඩ්‍රජන් පරිසර පද්ධතියේ සියලුම කොටස්කරුවන් සම්බන්ධීකරණය කිරීම;

4. හරිත හයිඩ්‍රජන් අගය දාමය තුළ සිදුවන අනනුකූල ක්‍රියා සම්බන්ධයෙන් සහ නුසුදුසු ස්ථාන හා බලාගාර පහසුකම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග සහ දඬුවම් පැනවීම සඳහා දැනට පවතින නීතිමය රාමුව ශක්තිමත් කිරීම.

5. බහුපාර්ශ්වික ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාව සතු බැඳීම් සහ ඒවාට අනුගත විය යුතු සියලුම පාර්ශ්වකරුවන් සතු බැඳීම් ප්‍රකාශයට පත් කිරීම සහ යාවත්කාලීන කිරීම;

6. දැනට ක්‍රියාත්මක ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත සම්බන්ධ කෙරෙනු ඇති මුළු දිවයිනම (අක්වෙරළ පහසුකම් ඇතුළුව) ආවරණය වන පරිදි හදිසි ප්‍රතිචාර ජාලයක් සුදුසු පුහුණු කාර්ය මණ්ඩලයක් සහ අවශ්‍ය අනෙකුත් සියලුම සම්පත් යොදවනු ලබමින් ස්ථාපිත කිරීම;

7. ජාතික ප්‍රමිතීන් කෙරෙහි සමස්ත අගය දායමයෙහි ඇති අනුකූලතාව අධීක්ෂණය කිරීම, සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත අන්තර්ජාතික මිණුම් සළකුණුවලට අනුකූලව අගය දාමය පුරා ප්‍රතීතනය සහතික කිරීම පිණිස සහාය ලබාදීම සිදුකෙරෙනු ඇති, අන්තර්ජාතික ප්‍රමිතීන් හා අනුරූප වූ හයිඩ්‍රජන් ජාතික ප්‍රමිතීන් පිළිබඳ විශේෂිත අංශයක්, පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් ද සහිතව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය තුළ ස්ථාපිත කිරීම;

8. හරිත හයිඩ්‍රජන් පරිසර පද්ධතිය සඳහා අවශ්‍ය කෙරෙන උපකරණ, උපාංග, කොටස්වල ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් ඒවායේ ප්‍රසම්පාදන අදිරයේදී සහතික කෙරෙන්නා වූ

යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. උදාහරණයක් ලෙස, මෙය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට අනුබද්ධිත සුදුසු තාක්ෂණික විශේෂඥ කමිටුවක් විසින් ඇගයීමට ලක් කිරීම සහ අනුමැතිය ලබා දීම හරහා සිදු කල හැකිය. අවශ්‍ය ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන් සපුරා ඇත්නම්, දේශීයව නිපදවන ලද උපකරණ, උපාංග, කොටස් ප්‍රසම්පාදනය ප්‍රවර්ධනය කිරීමට මෙම කමිටුව විසින් කටයුතු කරනු ඇත.

8.0 ක්‍රියාත්මක කෙරෙන ආකාරය

මෙම ප්‍රතිපත්තිය බලාත්මක වන දින සිට වසරක් ඇතුළත උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම, ආරක්ෂක නීති රීති සහ ප්‍රමිතීන් සකස් කරනු ලබන අතර මාර්ග සිතියම යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබේ. සෑම වසර 5කට වරක් මෙම ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සිදු කරනු ලැබේ.

පද මාලාව

ජෛව-හයිඩ්‍රජන් - ජෛව අපද්‍රව්‍ය වලින් නිකුත්වන ජීව වායුව වැනි ජීව විද්‍යාත්මක ක්‍රියාවලීන්ගෙන් නිපදවන හයිඩ්‍රජන් වේ.

කාබන් උදාසීනත්වය - කාබන් ඉවත් කිරීම හෝ බැහැර කිරීම/ අංගාර තිර කිරීම සමඟින් විමෝචනයන් සමතුලිත කරවීම/ (කාබන් විමෝචනය අවම කිරීම අරමුණු කරගත් බලපෑම අවම කරන හානිපූරණ ස්වභාවයේ ක්‍රියාමාර්ග (off-setting)) හරහා කාබන් ඩයොක්සයිඩ් විමෝචනයන් ශුද්ධ-ශුන්‍ය බවට පත් කිරීම සාක්ෂාත් කර ගැනීම.

චක්‍රීය ආර්ථිකය - ප්‍රතිචක්‍රීකරණය සහ තිරසර ක්‍රියාපිළිවෙත් ඔස්සේ අපද්‍රව්‍ය බැහැර කිරීම සහ සම්පත් හැකිතාක් කල් භාවිතය අරමුණු කරගත් ආර්ථික ක්‍රමයකි.

ප්‍රධාන අනතුරු උපද්‍රව පාලනය (COMAH) - දැඩි ආරක්ෂක විධිවිධාන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම තුළින්, හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්න ඇතුළු අන්තරායකර ද්‍රව්‍ය ආශ්‍රිත ප්‍රධාන කාර්මික අනතුරුවල ප්‍රතිවිපාක වළක්වා ගැනීම සහ මඟහරවා ගැනීම සඳහා සකස් කරන ලද නියාමන රාමුවකි.

කාබන්හරණය කිරීම - බලශක්ති නිෂ්පාදනයෙන් සහ කර්මාන්ත කටයුතුවලින් කාබන් ඩයොක්සයිඩ් (CO_2) විමෝචනය වීම අවම කිරීම හෝ තුරන් කිරීමේ ක්‍රියාවලියකි.

විද්‍යුත් විච්ඡේදකය - විදුලිය භාවිතා කරමින් විද්‍යුත් විච්ඡේදනය හරහා ජලය හයිඩ්‍රජන් සහ ඔක්සිජන් බවට විභේදනය කරනු ලැබීම සඳහා යොදාගන්නා උපකරණයකි.

සැඟවුණු විමෝචන - නිෂ්පාදනයක් හෝ සේවාවක් නිපදවීමේදී, පිරිසැකසුම් කිරීමේදී සහ ප්‍රවාහනයේදී ඒ හා ආශ්‍රිතව සිදුවන මුළු හරිතාගාර වායු විමෝචනයන් වේ.

බලශක්ති සුරක්ෂිතතාව - රටේ අවශ්‍යතාවන් සපුරාලීම පිණිස ස්ථාවර සහ දැරිය හැකි මිලක් යටතේ බලශක්ති සැපයුමක් සහතික කරනු ලැබීම.

හරිත හයිඩ්‍රජන් - කාබන් ඩයොක්සයිඩ් විමෝචනය කිරීමකින් තොරව සූර්ය හෝ සුළං බලය වැනි පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් භාවිතයෙන් නිපදවනු ලබන හයිඩ්‍රජන් වේ.

හයිඩ්‍රජන් පරිසර පද්ධතිය - හයිඩ්‍රජන් නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම, භාවිතයට ගැනීම සහ බැහැර කිරීම ආශ්‍රිත සමස්ත අගය දාමයයි.

හයිඩ්‍රජන් හංගුරීකරණය - හයිඩ්‍රජන් අවශෝෂණය වීම හේතුවෙන් ලෝහයේ ශක්තිමත්භාවය දුර්වල වී පහසුවෙන් කැඩී යන සුළු බවට පත්ව විනාශ වීමේ හැකියාව ඉහළ යාම.

හයිඩ්‍රජන් ඉන්ධන කෝෂ - හයිඩ්‍රජන් ඔක්සිජන් සමඟ සංයෝග කිරීම මඟින් විදුලිය ජනනය කරන උපකරණයක් වන අතර එහි අතුරු ඵලයක් ලෙස ජලය නිපද වේ.

IEA - අන්තර්ජාතික බලශක්ති නියෝජිතායතනය

IRENA - අන්තර්ජාතික පුනර්ජනනීය බලශක්ති නියෝජිතායතනය

අන්තර්-පරිවර්තනය - හයිඩ්‍රජන් එහි ව්‍යුත්පන්න බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය (උදා: ඇමෝනියා, මෙතනෝල්) සහ එම ව්‍යුත්පන්න නැවත හයිඩ්‍රජන් බවට පරිවර්තනය කිරීම.

සාධාරණ බලශක්ති සංක්‍රාන්තිය - සේවකයින් සහ ප්‍රජාවන් සුරක්ෂිත කරමින්, සාධාරණ වූත් සහ සියල්ල අන්තර්ගත වූත් බලශක්ති සංක්‍රාන්තීන් සහතික කෙරෙන්නා වූ කාර්ය රාමුවකි.

ජීව චක්‍ර තක්සේරුව (LCA) - නිෂ්පාදනයක ආයු කාලයේ සියලු අදියරයන් හා සම්බන්ධ පාරිසරික බලපෑම් ඇගයීම.

බහුපාර්ශ්වික ගිවිසුම් (MAs) - හයිඩ්‍රජන් හා බලශක්ති ප්‍රතිපත්ති සහ පරිසරය සම්බන්ධයෙන් වූ සහයෝගීතාවය සඳහා රටවල් ගණනාවක් සම්බන්ධ වන අන්තර්ජාතික සම්මුතීන් හෝ ගිවිසුම්.

අවබෝධතා ගිවිසුම (MOU) –එකට ඒකරාශීව කැමැත්ත ප්‍රකාශ කරනු ලබන්නා වූ පාර්ශව දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර අපේක්ෂිත පොදු වැඩපිළිවෙලක් අරමුණු කරගනිමින් ඇති කරගන්නා වූ ගිවිසුමකි. පාර්ශවයන් විසින් නීතිමය බැඳීමක් ඇති කරගැනීමට අදහස් නොකරන අවස්ථාවන් හි දී හෝ පාර්ශවයන් හට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි ගිවිසුමක් ඇති කර ගත නොහැකි අවස්ථාවන් හි දී බොහෝ විට උපයෝගී කරගැනේ.

ශුද්ධ ශුන්‍ය උපායමාර්ගය - නිශ්චිත ඉලක්කගත වර්ෂයක් වන විට කාබන් උදාසීනත්වය ළඟා කර ගැනීම සඳහා වූ ජාතික සැලැස්මකි.

පැරිස් ගිවිසුම - 21 වන සියවස අවසන් වන විට ගෝලීය උණුසුම වැඩිවීම පූර්ව කාර්මික මට්ටමට වඩා සෙල්සියස් අංශක 2කට වඩා අඩුවෙන්, වඩාත් හිතකර ලෙස සෙල්සියස් අංශක 1.5 දක්වා මට්ටමකින් සීමා කර පවත්වා ගෙන යාම අරමුණු කරගත් අන්තර්ජාතික ගිවිසුමකි.

පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) - හයිඩ්‍රජන් සහ එහි ව්‍යුත්පන්නයන් හසුරුවනු ලබන සේවකයින් විසින් භාවිත කරන ආරක්ෂිත ආම්පන්න.

පුනර්ජනනීය බලශක්තිය - සූර්ය බලය, සුළං, ජල හා ජෛව බලශක්තිය වැනි කාලයත් සමඟ නැවත බලගැන්විය හැකි (ජනනය වන) ස්වභාවික මූලාශ්‍රයන්ගෙන් ලබාගන්නා බලශක්තිය.

පුනර්ජනනීය හයිඩ්‍රජන් - සුළං, සූර්ය බලය හෝ ජලය වැනි පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ලැබෙන විදුලිය උපයෝගී කරගනිමින් විද්‍යුත් විච්ඡේදනය හරහා ජලය හයිඩ්‍රජන් සහ ඔක්සිජන් බවට වෙන් කිරීමෙන් නිපදවන පිරිසිදු ඉන්ධනයකි.

අවදානම් තක්සේරුව - හයිඩ්‍රජන් නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම. ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම ආශ්‍රිතව ඇති විය හැකි අවදානම් ඇගයීමේ ක්‍රමික ක්‍රියාවලිය.

උපායමාර්ගික බලශක්ති මධ්‍යස්ථානය - බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා හයිඩ්‍රජන් නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම වෙනුවෙන් විශේෂයෙන් වෙන් කරනු ලබන ස්ථානයකි.

තිරසර ගුවන් යානා ඉන්ධන (SAF) - හයිඩ්‍රජන් මත පදනම් වූ ඉන්ධන ඇතුළු පුනර්ජනනීය මූලාශ්‍රයන්ගෙන් ලබාගන්නා විකල්ප ජෙට් ඉන්ධන

සැපයුම් දාම කළමනාකරණය - මූලාශ්‍රයේ පටන් පරිභෝගිකයා දක්වා වූ හයිඩ්‍රජන් නිෂ්පාදනය කිරීම හා බෙදා හැරීම සම්බන්ධ ක්‍රියාවලීන් සම්බන්ධීකරණය කිරීම.

මුදාහැරීම - ගබඩා කිරීමේදී හෝ ප්‍රවාහනයේදී ප්‍රවේසම සහතික කිරීම සඳහා හයිඩ්‍රජන් වායුව නිසි පාලනයකින් වායුගෝලයට නිදහස් කිරීම.

ඇමුණුම 1: ආශ්‍රිත පනත්, ප්‍රතිපත්ති සහ අන්තර්ජාතික සම්මුතීන්

(අ) ආශ්‍රිත පනත්

- 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත
- 1991 අංක 37 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභා පනත
- 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත
- 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත
- 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත
- 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත
- 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත
- 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත
- ඉඩම් සංවර්ධන ආඥා පනත සහ සංශෝධිත පනත
- 2008 අංක 36 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත

(ආ) ආශ්‍රිත ප්‍රතිපත්ති

ශ්‍රී ලංකාවේ හරිත හයිඩ්‍රජන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනෙකුත් අදාළ ජාතික ප්‍රතිපත්තිවලට (ඉන් ඇතැම් ඒවා පහත ලැයිස්තුගත කර තිබේ) පිටුබලය ලබා දෙන අතර ඒවා හා අනුපූරක වීම අපේක්ෂා කරයි.

- **ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග**
  https://www.energy.gov.lk/images/resources/downloads/national-energy-policy-2019-en.pdf
- **රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**
  http://www.env.gov.lk/web/images/downloads/policies/Chemical_Mgt_Policy.pdf
- **අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, පරිසර අමාත්‍යාංශය**
  https://env.gov.lk/web/images/pdf/policies/National_Policy_on_Waste_Management_English.pdf
- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**
  https://www.niosh.gov.lk/images/2020/OSH_Policy_2014.pdf
- **ජාතික පරිසර ප්‍රතිපත්තිය**
  http://www.env.gov.lk/web/images/pdf/policies/National_Environment_Policy_-_English.pdf
- **ජාතික සුනිසි රැකියා ප්‍රතිපත්තිය**
  https://www.ilo.org/sites/default/files/wcmsp5/groups/public/@asia/@ro-bangkok/@ilo-colombo/documents/publication/wcms_114045.pdf

(ඇ) ආශ්‍රිත අන්තර්ජාතික සම්මුතීන් සහ බැඳීම්

- දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය යටතේ වන පැරිස් ගිවිසුම
- දේශසීමා හරහා අන්තරාදායක අපද්‍රව්‍ය ප්‍රවාහනය හා බැහැර කිරීම පිළිබඳ බාසල් සම්මුතිය
- දිගුකල් පවතින කාබනික දූෂක (POPs) පිළිබඳ ස්ටොක්හෝම් සම්මුතිය
- ඕසෝන් වියන සුරැකීම සඳහා වන වියනා සම්මුතිය
- රසදිය පිළිබඳ මිනමාටා සම්මුතිය
- ජාත්‍යන්තර වෙළඳාමේ ඇතැම් උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය සහ පළිබෝධනාශක සම්බන්ධයෙන් පූර්ව දැනුම් දීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ රොටර්ඩෑම් සම්මුතිය
- දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති රාමුව (UNFCCC)
- රසායනික ද්‍රව්‍ය පිළිබඳ ගෝලීය රාමුව (GFC)
- වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වන සතුන් හා ශාකවල අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES)
- විශේෂයෙන් ජලජ පක්ෂීන්ගේ ස්වභාවික වාසස්ථාන ලෙස අන්තර්ජාතිකව වැදගත් වන තෙත්බිම් පිළිබඳ රැම්සාර් සම්මුතිය
- එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය (UNCLOS) සහ ජාතික අධිකරණ බල සීමාවෙන් ඔබ්බට පිහිටි ප්‍රදේශවල ජෛව විවිධත්වය (BBNJ) පිළිබඳ අදාළ ගිවිසුම